*Secretary*
*Scholarship Committee*
*10 Chatswood Close*
*Glen Waverley, VIC 3150*
*Australia*

Sri Mithuru

*Web:*[www.srimithuru.org](http://www.srimithuru.org)
*email:*[scholarships@srimithuru.org](mailto:scholarships@srimithuru.org)

---

## <u>ශ්‍රී මිතුරු ශිෂ්‍යත්වලාභියෙකු විසින් දැන ගත යුතු කරුණු සහ කොන්දේසි</u>

ශ්‍රී මිතුරු යනු ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර වෙසෙන ශ්‍රී ලාංකික මිතුරු මිතුරියන් පිරිසක් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් එක්ව, ඔවුනොවුන් අතර සුහදත්වය වර්ධනය කර ගැනීමත්, බාල හා තරුණ පරම්පරාව අතර අපගේ සංස්කෘතික පසුබිම පිළිබඳව ඇති දැනුවත්භාවය ඉහල නැංවීමත්, අවශ්‍ය අවස්ථාවන්හිදී අපගේ මව් බිමේ ජනතාවට උදව් උපකාර කිරීමත් යන අරමුණු පෙරදැරි කරගෙන පිහිටුවාගත් සංගමයකි. ශ්‍රී මිතුරු සහ එහි ක්‍රියාකාරකම් පිළිබඳව වැඩි විස්තර ඉහත සඳහන් අපගේ වෙබ් අඩවිය ඔස්සේ ඔබට දැන ගත හැකිය.

ශ්‍රී මිතුරු ශිෂ්‍යත්ව වැඩසටහන, අප සංගමය මගින් 2012 වසරේ පටන් කරගෙන එනු ලබන තවත් එක් ව්‍යාපෘතියකි. මෙම වැඩසටහන තුලින් අප බලාපොරොත්තු වන්නේ, ශ්‍රී ලංකාවේ සිටින ඉගෙනීමට දක්ෂ එහෙත් ආර්ථික අපහසුකම් නිසා තම අධ්‍යාපන කටයුතු හරියාකාරව කරගත නොහැකි දරුවන්ට උපකාර කිරීමයි. මෙම ශිෂ්‍යත්ව ලබා දීමේ වැඩසටහන කරගෙන යනු ලබන්නේ ශ්‍රී මිතුරු හා සම්බන්ධ පවුල්වල මූල්‍යමය දායකත්වයෙනි.

ඔබට ලබා දී ඇති මෙම ශිෂ්‍යත්වය යටතේ ඔබගේ අධ්‍යාපන කටයුතු සඳහා වියදම් කිරීමට මාසයකට රුපියල් 2500 ක ආධාර මුදලක් ඔබට ලැබෙනු ඇත. මෙම මුදල ඔබ විසින් ලබාදෙනු ලබන බැංකු ගිණුමට මාසිකව බැර කෙරෙයි. ඔබට ලබා දී ඇති මෙම ශිෂ්‍යත්වය ඔබ උසස් පෙළ විභාගයට පළමුවරට පෙනී පෙනී සිටින මාසය දක්වා වලංගු වෙයි. එහෙත් ඒ සඳහා පහත කරුණු ඉටුවිය යුතුය.

1. ඔබට පළමු වාරිකය ලැබුණු විට ඒ බව අප වෙත ඉක්මනින් දැන්විය යුතුය. ලිපියක්, ඊ මේල් පණිවිඩයක්, කෙටි පණිවිඩයක්, හෝ දුරකථන ඇමතුමක් මඟින් ඔබට මෙය කල හැකිය. මාස 3ක් ඇතුලත අප වෙත  දැනුම් දීමක් නොලැබුණහොත් ඔබට ආධාර මුදල් ලබාදීම නවත්වනු ඇත.

2. ඔබ නිතිපතා (මාස තුනකට වරක්වත්) ඔබට ලබා දෙන ආධාර මුදල් වියදම් කල ආකාරය පිලිබඳ තොරතුරු අප වෙත දැන්විය යුතුය. මෙම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ඔබට ලැබෙන මුදල් ඔබගේ අධ්‍යාපන කටයුතු සඳහාම පමණක් භාවිතා කළ යුතුය. පවුලේ වෙනත් අවශ්‍යතාවයන් හෝ ඉතිරි කිරීම් වෙනුවෙන් මෙම මුදල් භාවිතා නොකළ යුතුය. පොත්පත් හෝ වෙනත් අධ්‍යාපනයට අවශ්‍ය දෑ මිලදී ගැනීම, පුද්ගලික පන්ති ගාස්තු ගෙවීම, ඇඳුම් පැළඳුම් ගැනීම, ගමන් වියදම් හෝ නේවාසිකාගාර ගාස්තු ගෙවීම වැනි අවශ්‍යතාවයන්වලට මෙම මුදල් වියදම් කල හැකිය.

3. ඔබගේ අධ්‍යාපන කටයුතුවල ප්‍රගතිය හා ඔබගේ අර්ධ වාර්ෂික/වාර්ෂික ප්‍රගති වාර්තාවල පිටපත් ඒවා ලැබුණු විට නොපමාව අප වෙත එවිය යුතුය.

4. ඔබගේ දුරකථන අංකය, ලිපිනය වැනි පෞද්ගලික තොරතුරුවල යම් වෙනසක් සිදුවුවහොත් ඒ බැව් නොපමාව අප වෙත දැනුම් දිය යුතුය. විශේෂයෙන්ම ඔබගේ දුරකථන අංකය වෙනස් වී, ඒ බැව් අප වෙත නොදැන්වීම නිසා අපට කිසියම් කාරණයක් සඳහා ඔබව දිගින් දිගටම සම්බන්ධ කර ගැනීමට නොහැකි වුවහොත් එය ඔබගේ ශිෂ්‍යත්වය අවලංගු කිරීමට හේතුවනු ඇත.

5. ඔබගේ ශිෂ්‍යත්වය උසස් පෙළ දක්වාම දීර්ඝ කර ගැනීමට නම් ඔබ සාමාන්‍ය පෙළ විභාගය පලමු අවස්ථාවෙන්ම සමත් විය යුතුය.

6. අප විසින් පත් කර ඇති ඔබගේ සම්බන්ධීකාරකයාට අවශ්‍ය අවස්ථාවන්හිදී ඔබව ඍජුවම අමතා හෝ පාසලේ විදුහල්පතිතුමා/තුමිය හෝ පන්තිභාර ගුරුතුමා/තුමිය අමතා හෝ ඔබගේ අධ්‍යාපන කටයුතුවල ප්‍රගතිය විමසීමට ඉඩ ඇත. ඉල්ලුම්පත්‍රය යොමු කරන අවස්ථාවේ හෝ ප්‍රගතිය පිළිබඳව හෝ ඔබ සාවද්‍ය තොරතුරු සපයා ඇති බව අපට දැනගන්නට ලැබුනහොත් ඕනෑම අවස්ථාවක ඔබගේ  ශිෂ්‍යත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

7. ඔබ විසින් කරන ලද නිර්මාණ (චිත්‍ර, වෙසක් පත්, නත්තල් හෝ අවුරුදු සුභ පැතුම්, ලිපි වැනි) අප වෙත එවන්නේ නම් මෙම ශිෂ්‍යත්වය කෙරේ ඔබ උනන්දුවක් දක්වන අයෙක් බව අපට තහවුරු වෙයි. එසේම එය අපව දිරි ගන්වයි.

ඔබගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමටත් ඒ තුලින් ඔබගේ අනාගතය සාර්ථක කර ගැනීමටත් ශ්‍රී මිතුරු ශිෂ්‍යත්වය රුකුලක් වනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු.

ඔබට සුභ අනාගතයක්!

ශ්‍රී මිතුරු ශිෂ්‍යත්ව කමිටුව